**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**
**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**
**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**
No. 6 1/B, Layards Road, Colombo 05. **Tel:** +94112584047 / +94114503001
**Fax:** +94112584047 **E-mail:** cmev@cpalanka.org **Web:** www.cmev.org

2022 ජනවාරි 19 දින.

**මැතිවරණ කොමිසමේ සාමාජිකයින් දෙදෙනෙකුට මරණීය තර්ජන එල්ලවීම පිලිබඳ විශේෂ මාධ්‍ය ප්‍රකාශනය**

ඊයේ (ජනවාරි 18 දින) සවස් භාගයේ මැතිවරණ කොමිසමේ සාමාජිකයන් දෙදෙනෙකු වන කේ.කේ.පී. පතිරණ මහතා සහ එස්.බී. දිවාරත්න මහතා හට කොමිසමේන් ඉල්ලා අස්වන ලෙසට මරණීය තර්ජන එල්ල වී ඇති බවට චෝදනාවක් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට (මැ.ප්‍ර.නි.ම) වාර්තා වේ. මෙවැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී සහ ප්‍රචණ්ඩකාරී ක්‍රියා මැ.ප්‍ර.නි.ම. දැඩි ලෙස හෙලා දකින අතර පොලිස් අපරාධ විමර්ශන අංශය දැනටමත් ආරම්භකර ඇති පරීක්ෂණ පූර්ණ විනිවිධ භාවයෙන් යුතුව පවත්වන ලෙස ඉල්ලා සිටී.

පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණය කල් දැමීමට විවිධ පාර්ශවයන් විසින් ගන්නා ලද ආසන්න උත්සාහයන් පිලිබඳ මැ.ප්‍ර.නි.ම. කණගාටුව ප්‍රකාශ කරන අතර මෙයද එම උත්සාහයේම දිගුවක් වීමට ඇති ඉඩ පිලිබඳ ද අවධානය යොමුකර සිටී. එබැවින් මැතිවරණ නිළධාරින් ඇතුලූ සියලූම මැතිවරණ ක්‍රියාකාරීන්ට කිසිදු අනිසි බලපෑමකින් තොරව සහ පළාත් පාලන මැතිවරණ ආඥාපනතේ දක්වා ඇති කාලසීමාව තුල මැතිවරණය පැවැත්වීම සඳහා සාමකාමී හා සුරක්ෂිත පරිසරයක් සහතික කරන ලෙස මැ.ප්‍ර.නි.ම. රජයෙන් ඉල්ලා සිටී.

එමෙන්ම මෙවැනි කණගාටු දායක සිදුවීම මගින් පළාත් පාලන මැතිවරණය තවදුරටත් ප්‍රමාද වීමක් සිදුනොවීමට කටයුතු කරන මෙන් මැ.ප්‍ර.නි.ම. මැතිවරණ කොමිසමෙන් ඉල්ලා සිටී.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (මැ.ප්‍ර.නි.ම.) 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාත සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.

ආචාර්ය පී සරවනමුත්තු
සම කැඳවුම්කරු

ලසන්ත ද සිල්වා
සම කැඳවුම්කරු

උදය කළුපතිරණ
සම කැඳවුම්කරු